# රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
## அரசாங்க நிர்வாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
## Ministry of Public Administration and Disaster Management

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07 இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | 76/1/15/විශේෂ X වෙළුම | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2019.03.22 |

අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම</u>**

**<u>2018.01.01 සහ 2018.07.01</u>**

උක්ත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2019.03.13 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදන හා බැඳේ.

02. 2018.01.01 හා 2018.07.01 දිනට පවත්නා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අයදුම්පත් කැඳවන ලද යොමුගත නිවේදනයන්හි සපුරාලිය යුතු සුදුසුකම් යටතේ VI වශයෙන්, 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කළ යුතු බව දක්වා ඇත.

03. එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2015 හි 02 ඡේදයේ VI මඟින් දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නව සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013.12.23 වන දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර පහක (05) සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් තුන්වන (III) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

04. තවද, 2008.12.23 දිනෙන් පසු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් වශයෙන් තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයද නියමිත දිනට සම්පූර්ණ කළ යුතු බව වැඩිදුරටත් දන්වමි.

05. ඒ අනුව, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2019.04.05** දක්වා දීර්ඝ කරන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ආපදා
කළමනාකරණ අමාත්‍යාංශය


දුරකතන / தொலைபேசி / Telephone: 011-269611-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk